සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
**Year End Evaluation - 2023 (2024)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: **පුරවැසි අධ්‍යාපනය** | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name ........................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුය

- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

---

## I කොටස

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජාතික කොඩියේ වම් පස කොළ හා කහ පැහැති තීරුවෙන් නියෝජනය වන්නේ,
    1. ජාතීන් අතර එකමුතු බවයි.
    2. කහ තීරුවෙන් දෙමළ ජනවර්ගය හා කොළ තීරුවෙන් මුස්ලිම් ජනවර්ගය නියෝජනය වේ.
    3. කහ තීරුවෙන් මුස්ලිම් ජනවර්ගය නියෝජනය වේ.
    4. රට වැසියන් අතර සමානාත්මතාව පිළිබිඹුවේ.

02. ජාතික කොඩිය එසවීමේදී අනුගමනය කළ යුතු රීතියක් වන්නේ,
    1. එසවීම හා පහත් කිරීම සෙමෙන් හා ගෞරවාන්විතව සිදු කිරීම.
    2. හානි වූ හා අවලක්ෂණ කොඩි භාවිත කිරීම.
    3. සිංහයා උඩු යටිකුරු කර ප්‍රදර්ශණය කිරීම.
    4. අඳින ඇඳුමක් ඇතිරිල්ලක් ලෙස භාවිත කිරීම.

03. න්‍යෂ්ටික පවුලට වඩා සාපේක්ෂව විස්තෘත පවුලේ විශේෂත්වය වන්නේ.
    1. පවුලේ සාමාජික සංඛ්‍යාව අඩුය.
    2. පවුලේ ආර්ථික කටයුතු සඳහා දායකත්වය අඩුය.
    3. ආරක්ෂාව හා සෙනෙහස නොලැබීම.
    4. පවුලේ උසස් ගුණාංග බාල පරපුරට කුඩා කළ සිට හුරු පුහුරු වීම.

04. විවේකය ඵලදායි ලෙස ගත කරගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ,
    1. ක්‍රීඩා වල යෙදීම සුදුසු ය.
    2. මිතුරන් සමඟ ගමන් බිමන් යාම සුදුසු ය.
    3. පාසල් මිතුරන් සමඟ කල්ගත කිරීම සුදුසු ය.
    4. අසල් වැසියන් සමඟ අල්ලාප සල්ලාප වල යෙදීම සුදුසු ය.

05. ඔබගේ පියාගේ අයියාගේ බිරිඳ ඔබේ,
    1. ලොකු අම්මා / මහම්මා ය.
    2. ලොකු අම්මා / නැන්දා ය.
    3. පුංචි අම්මා / කුඩම්මා ය.
    4. නැනා / පුංචි අම්මා ය.

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රකාශන හරිනම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. සමාජයේ යහපැවැත්ම සඳහා පුරවැසියන් තමන්ට පැවරෙන කාර්යයන් ඉටුකිරීම යුතුකම් ලෙස අර්ථවත් වේ. (............)
07. තෛපොංගල් උත්සවය සමරන්නේ ඉස්ලාම් බැතිමතුන් විසිනි. (............)
08. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නුග ගසයි. (............)
09. විනය ගරුක බව පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු සාරධර්මයකි. (............)
10. අයහපත් චිත්තවේග තත්වයන් පාලනය කර ගැනීම සඳහා ආගමික කටයුතු වල යෙදීම වැදගත් වේ (............)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වරහන තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

11. බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේදී භාණ්ඩ මිලදී ගන්නා විට ............................... පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
12. පවුල් ඒකකය තුළ ඥාති ............................... පවත්වාගෙන යාම නිසා සාමාජිකයන්ට ප්‍රයෝජන රාශියක් අත් වේ.
13. රාජ්‍ය ලාංඡනයේ තිබෙන වී කරල් මගින් ............................... සංකේතවත් වේ.
14. ............................... මත ගොඩනැඟී තිබීම පවුලක් තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි.
15. ජීවන අභියෝග ජයගැනීමට ............................... කටයුතු කළ යුතුය.
(සම්බන්ධතා, සිරිත් විරිත්, ගුණාත්මක භාවය, සෞභාග්‍යය, ඥාතීත්වය, සහෝදරත්වය, නිර්මාණශීලීව)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට සුදුසු නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

16. පුද්ගලයා තුළ විවිධ අවස්ථාවන්වල ඇතිවන සිතුවිලි හා හැඟීම් ............................... ලෙස හැඳින්වේ.
17. ජාතික පක්ෂියා ලෙස නම් කර ඇත්තේ ............................... ය.
18. පුස්තකාලය ජන සමාජයේ ............................... හේතුවන ආයතනයකි.
19. අපේ ආහාර අවශ්‍යතා ඉටුකරගැනීමට අවශ්‍ය බොහොමයක් ............................... ආශ්‍රිත ක්ෂේත්‍ර වලින් සැපයේ.
20. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වෘත්තිකයන්ගේ ............................... සුරැකීම සඳහා නීති රීති රැසක් ක්‍රියාත්මක වේ.

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනික් එක් එක් ප්‍රශ්ණයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. i. පවුලක සාමාජිකයෙකු ලෙස ජීවත්වීම නිසා ඔබට අත්වන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න.
ii. සෞන්දර්යාත්මක ක්‍රියාකරකම් වල යෙදීම නිසා ඇතිවන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
iii. පුද්ගලයා තුළ ඇතිවන චිත්තාවේග දෙකක් සඳහන් කරන්න.
iv. වර්තමාන පවුල් ඒකක මුහුණපාන අභියෝග දෙකක් නම් කරන්න.
v. පවුල තුළ පවතින සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් දෙකක් සඳහන් කරන්න.
vi. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන දෛනිකව අපට අවශ්‍ය තොරතුරු දෙකක් නම් කරන්න.
vii. සංස්කෘතික අංග දෙකක් ලියා දක්වන්න.
viii. ජාතික ගීය ගායනා කරන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2x8=16)

02. i. සංස්කෘතික විවිධත්වයට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
ii. කතෝලික ආගම හා බැඳුණු උත්සව හතරක් නම් කරන්න. (ලකුණු 4)
iii. පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු සාරධර්ම පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

03. i. වර්තමාන ජන සමාජයේ පවතින පවුල් ඒකක ඒවායේ සාමාජිකත්වය අනුව බෙදා වෙන්කරනු ලබන වර්ග දෙක නම් කරන්න. (ලකුණු 2)
ii. පාසල් සිසුවකු වශයෙන් විභාගය හොඳින් සමත්වීමට ඔබ විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
iii. විවේකය ගත කිරීම සඳහා හොඳ මාධ්‍ය වැඩසටහන් පරිහරණය කිරීම වැදගත් වේ. ඔබ නැරඹූ හොඳ රූපවාහිනී වැඩසටහන් පහක් නම් කරන්න. (ලකුණු 5)

04. i. ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා දෙකක් නම් කරන්න. (ලකුණු 2)
ii. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)
iii. යහපත් පුරවැසියකු සතු ගුණාංග පහක් ලියන්න. (ලකුණු 5)

05. i. ඔබගෙන් පවුලේ සාමාජිකයන්ට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)
ii. අසල්වාසීන් සමඟ සුහදව කටයුතු කරන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු 4)
iii. අසල්වාසීන් සමඟ සුහදව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

06. i. ජන සමාජයක පුද්ගලයාට හිමි අයිතිවාසිකම් බෙදනු ලබන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2)
ii. අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් හතරක් සඳහන් කරන්න. ලකුණු 4)
iii. ජන සමාජයේ යහපත් පුද්ගලයකු ලෙස ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග පහක් ලියා දක්වන්න. (ලකුණු 5)

07. i. සංස්කෘතික විවිධත්වයට හේතු දෙකක් ලියන්න. (ලකුණු 2)
ii. ශ්‍රී ලංකාවේ වෙසෙන ජන වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 4)
iii. සංස්කෘතික දායාද ආරක්ෂාකර ගැනීම සඳහා පුරවැසියකු වශයෙන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | පිළිතුරු පත්‍රය

## I - කොටස

| අනු අංකය | පිළිතුර | අනු අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 02 | 11 | ගුණාත්මක භාවය |
| 02 | 01 | 12 | සම්බන්ධතා |
| 03 | 04 | 13 | සෞභාග්‍යය |
| 04 | 01 | 14 | ඥාතීත්වය |
| 05 | 01 | 15 | නිර්මාණශීලීව |
| 06 | √ | 16 | චිත්තාවේග |
| 07 | x | 17 | වළි කුකුළා |
| 08 | x | 18 | යහපතට |
| 09 | √ | 19 | කෘෂිකර්මය |
| 10 | √ | 20 | අයිතිවාසිකම් |

(මුළු ලකුණු 2×20=40)

## II - කොටස

01. i. පෙළපොතේ 6 පිටුවේ සටහනේ තිබෙන කරුණු දෙකක් ලිවීමට ලකුණු ලබා දෙන්න.

ii. විනෝදය, වින්දනය, චිත්තවේග පාලනය, චිත්තවේග සංයමයෙන් යුතුව ප්‍රකාශ කිරීමේ හැකියාව, ජීවිතයේ විවිධ අවස්ථා සෞන්දර්යාත්මකව දැකීම.

iii. සතුට, දුක, තරහව, කෝපය

iv. සාමාජිකයන්ගේ ආරක්ෂාව හා රැකවරණය අහිමිවීම.
දෙමාපිය ආදරය රැකවරණය නොලැබීම.
බාහිර පුද්ලයන්ගේ රැකවරණයට හා ආදරයට ලක්වීම.

v. නව නිවසකට මුල්ගල් තැබීම, නව නිවසක පදිංචි වීම, අකුරු කියවීම, ඉඳුල් කටගෑම, විවාහ මංගල උත්සව, අවමංගල උත්සව ආදියේ සිදුකරන සිරිත් විරිත්

vi. පෙළපොත 56 පිටුවේ සඳහන් පිළිතුරු දෙකක් ලිවීමට ලකුණු 2 ක් ලබා දෙන්න.

vii. ආගම, දැනුම, ඇදහිලි හා විශ්වාස, අධ්‍යාපනය, සිරිත් විරිත්, කලා ශිල්ප, ආහාරපාන, ඇඳුම් පැළඳුම්, සාහිත්‍ය භාෂාව ආදිය

viii. ජාතක උත්සව, රාජ්‍ය උත්සව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායක උත්සව, පාසල් හා වෙනත් පොදු වැදගත්කම් සහිත උත්සව, ජාත්‍යන්තර තරග වෙනත් වැදගත් උත්සව

02. i. ජනවර්ග, ආගම, භාෂාව, ජීවනෝපාය මාර්ග
ii. නත්තල් උත්සවය, මහසිකුරාදා, පාස්කු ඉරිදා, දේවස්ථාන මංගල්‍ය උත්සව.
iii. විනය ගරුක බව, අවංක බව, ඉවසීම, නිහතමානී බව, ත්‍යාගශීලී බව, මිත්‍රශීලී බව, කාරුණික බව, ක්‍රෝධ නොකිරීම

03. i. න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල
ii. දිනපතා පාසල් යාම, ගුරුවරුන්ට කීකරුවීම, ගුරු උපදෙස් පිළිපැදීම, හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම, කාල සටහනකට අනුව වැඩ කිරීම, සාධනය අඩු විෂයයන් හඳුනා ගැනීම.
iii. රූපවාහිනී වැඩ සටහන් 2 ලිවීමට ලකුණු 2 ක් ලබා දෙන්න. විස්තර කිරීමට ලකුණු 3 ක් ලබා දෙන්න.

04. i. මසුන් ඇල්ලීම, මාංශ වෙළඳාම, කරවල වේලීම, කරවල වලින් උම්බලකඩ නිෂ්පාදනය, ආම්පන්න නිපදවීම ආදිය
ii. පෙළ පොතේ 36 පිටුවේ අයිතිවාසිකම් 4 ලිවීමට ලකුණු 4 ක් ලබා දෙන්න.
iii. පෙළ පොතේ 38 පිටුවේ සඳහන් ගුණාංග 5 ලිවීමට ලකුණු 5 ක් ලබා දෙන්න.

05. i. දෙමාපියන්ට ආදරය කිරීම, වැඩිහිටියන්ට ආදරය කිරීම, සෙනෙහස දැක්වීම, කීකරුවීම, ගෞරව කිරීම
ii. ශ්‍රමදාන කටයුතු, පොදු ආගමික උත්සව, උළු සෙවිලි කිරීමේ අවස්ථා, නිවාස තැනීම, ගෙබිම කැපීම, අවමඟුල් අවස්ථා, ආහාරපාන ආදිය සැකසීම.
iii. - ආරක්ෂාව සැලසේ
- නිත්‍යානුකූල නොවන ක්‍රියා කරන්නන් හඳුනාගත හැක.
- විපතකදී පිහිට වේ.
- අවිධිමත් ලෙස කසල බැහැර කිරීම් අවස්ථා හඳුනාගත හැකි කරුණු විස්තර කිරීමට ලකුණු 3 ක් ලබාදෙන්න.

06. i. සිවිල් අයිතිවාසිකම්, දේශපාලන අයිතිවාසිකම්
ii. හොඳින් ඉගෙනීම, වෙනත් ආගමික කොටස් වලට හිරිහැර නොකිරීම, අන් අයගේ හිත් රිදෙන ලෙස කථා නොකිරීම, අන් අයට කරදර නොවන ලෙස ජීවත්වීම
iii. යුතුකම් ඉටුකිරීම, නීතිගරුක බව, චාම් දිවිපැවැත්ම, අන් මත ඉවසීම, අන් අයට ආදරය කිරීම ආදී පෙළපොත් 6 පිටුවේ සඳහන් පිළිතුරු 5 ලිවීමට ලකුණු 5 ලබා දෙන්න.

07. i. ජනවර්ග, ආගම්, භාෂාව, ජීවනෝපාය මාර්ග
ii. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ, වෙනත්
iii. පෙළ පොත 87 පිටුවේ සඳහන් පිළිතුරු දෙකක් ලිවීමට ලකුණු 2 ක් හා විස්තර කිරීමට ලකුණු 3 ක් ලබා දෙන්න.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න